# අපි ආදරෙන් ඉන්නවා

## ආගමික සහජීවනය වෙනුවෙන්
## ළමා මනසට



International Movement Against All Forms of Discrimination and Racism-Asia Committee
සියළු වර්ගවාදයට හා වෙනස්කම් කිරීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය - ආසියා කමිටුව
சகல விதமான பாகுபாடு மற்றும் இனவாதத்திற்கு எதிரான சர்வதேச இயக்கம் - ஆசியாவிற்கான குழு

EUROPEAN UNION

| | | |
|---|---|---|
| රූකඩ පිටපත | : | රන්ජන් ප්‍රනාන්දු |
| පිටු සැකැස්ම සහ කාටූන් | : | දමයන්ති මුතුකුමාරණගේ |
| චිත්‍ර සටහන් | : | ශ්‍යාමා ජයනි පිත්තවඩු |

---


International Movement Against All Forms of Discrimination and Racism-Asia Committee

සියළු වර්ගවාදයට හා වෙනස්කම් කිරීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය - ආසියා කමිටුව

சகல விதமான பாகுபாடு மற்றும் இனவாதத்திற்கு எதிரான சர்வதேச இயக்கம் - ஆசியாவிற்கான குழு

අංක: 1149A, කෝට්ටේ පාර, රාජගිරිය, ශ්‍රී ලංකා
දුරකථන අංකය: ( + 94-11) 5757323
ෆැක්ස්: ( + 94-11) 2884559
E-mail: info@imadr.org

ලෝකය පුරා මිනිසුන්ගේ සමේ පාට,
හිස කෙස් වල පාට, ආගමික විශ්වාස,
සංස්කෘතික චාරිත්‍ර වාරිත්‍ර, ඇඳුම් පැළඳුම් වෙනස්.
ඒ විවිධත්වය නිසා තමයි ලෝකය
ලස්සනට පාට පාටින් පෙනෙන්නේ.

අපි හැමෝම ඒ විවිධත්වයට ගරු කරන නිසා තමයි
සමගියෙන්, ආදරයෙන් ජීවත් වෙන්නේ.

මේ වෙනස පරිසරයටත් පොදුයි.





පාට පිරුනු නෙක නෙක සුවඳ මල් වර්ග,
ගස් වැල් තමයි ලෝකයට
ජීවය ලබා දෙන්නේ.
ඇළ, දොළ ගංගා, මහ සයුර තමයි
ලෝකයට සිසිල ලබා දෙන්නේ,
පස සාරවත් කරන්නේ.





පාට පාට කුරුල්ලන්,වෙනස් රසයන්ගෙන්
පිරුනු පළතුරුවර්ග,
එළවළු වර්ග අපිට ආහාර ලබා දෙනවා.
හිරු එළිය ලෝකයට එක සමානව
එළිය ලබා දෙනවා.





ලෝකයේ පවතින විවිධත්වයට ගරු නොකරන
අපේ බොහෝ වැඩිහිටියන් ආගම් වලට,ජාතීන් වලට
බෙදිලා ලෝකය බෙදා වෙන්කර ගන්න
ඇන කොටා ගන්නවා.





මිනිසුන්ගේ අනුවනකම් නිසා
රටවල් අතර, ජාතීන් අතර
බිය, වෛරය, වෙනස්කොට සැලකීම වැනි
නපුරු හැගිම් ඇති වෙනවා.
මෙහි ප්‍රතිඵලයක් ලෙස විශාල
යුද්ධ පවා ඇති වෙනවා.
සිය දහස් ගණන් මිනිසුන් මිය යනවා.
ගස් වැල්, සතුන් මිය යනවා.
පරිසරය විනාශ වෙනවා.





ජාති වාදයෙන්,ආගම් වාදයෙන්, කුල වාදයෙන් වෙන් නොවී
සියලු මිනිසුන් එක්ව විවිධත්වය විඳිමින්
ආදරය තුළ සියල්ල බෙදා හදා ගනිමින්
ලෝකය අපට දායාද කළ සුන්දර දේවල්
ආරක්ෂා කිරීම අපේ යුතුකමක්.






ලෝකය අපට දායාද කළ සුන්දරත්වය රැක ගනිමු. විවිධත්වයට ගරු කරමින් ලෝකයට ආදරය බෙදා දෙමු.
අපි හැමෝම යාළුවෝ.

අපේ දරුවන්ට ආදර්ශමත් ලෙස ආදරය තුළ සියල්ල බෙදා හදා ගනිමින්
ලෝකය අපට දායාද කළ සුන්දර දේවල් ආරක්ෂා කිරීම වැඩිහිටි අපේ වගකීමක්.



International Movement Against All Forms of Discrimination and Racism-Asia Committee

සියළු වර්ගවාදයට හා වෙනස්කම් කිරීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය - ආසියා කමිටුව

சகல விதமான பாகுபாடு மற்றும் இனவாதத்திற்கு எதிரான சர்வதேச இயக்கம் - ஆசியாவிற்கான குழு

EUROPEAN UNION

